# ProYouth තරගාවලියට අදාළ තරග කොන්දේසි හා නිර්ණායක

## තරග කොන්දේසි පහත පරිදි වේ.

- ❖ සෑම ඉදිරිපත් කිරීමක ම පහත කරුණු ඇතුළත් විය යුතුය.

අ) ඉදිරිපත් කිරීම් තුළ හඳුනාගත් ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අවස්ථාව (Opportunity for Productivity Improvement) , ඔබේ විසඳුම, එම විසඳුම ක්‍රියාත්මක කරන ආකාරය, එමගින් අපේක්ෂිත ප්‍රතිඵලය කුමක්ද යනවග අන්තර්ගත විය යුතුය.

ආ) එක් තරගකරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් ඉදිරිපත් කිරීමක් පමණි.

ඇ) වීඩියෝ පටය හෝ ඉදිරිපත් කිරීම තරගකරුවාගේ ම නිර්මාණයක් විය යුතුය.

ඈ) වීඩියෝ පටය තත්පර 10-30 විය යුතු අතර ලිඛිත ව්‍යාපෘති යෝජනා වචන 1000කට නොවැඩි විය යුතුය. Power Point Presentation ආකාරයේ ඉදිරිපත් කිරීමක්නම් slides 10කට නොවැඩි විය යුතු ය.

(ඉ)මෙම ඉදිරිපත් කිරීම් pdf වශයෙන් ඉදිරිපත් කළ යුතු ය.

(ඊ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ දැනුම් දීම මත වීඩියෝ පට නිර්මාණයට යොදා ගත් ප්‍රේරක (prompts) ඉදිරිපත් කළ යුතුයි.

## තරග නිර්ණායක සහ නිශ්චිත ලකුණු පහත පරිදි වේ.

**1.රාජ්‍ය හෝ පුද්ගලික අංශයන්හි ක්‍රියාවලි වැඩි දියුණුව සඳහා AI හෝ Digital තාක්ෂණය භාවිතා කළ හැකි ලිඛිත ව්‍යාපෘති යෝජනා තරගය**

| අංකය | තරග නිර්ණායක | නිශ්චිත ලකුණු මට්ටම |
|---|---|---|
| 01 | රාජ්‍ය හෝ පුද්ගලික අංශයට අදාළ ක්‍රියාවලියක් වැඩි දියුණු කිරීමේ අවස්ථාවක් නිවැරදිව හඳුනාගෙන තිබීම | 35 |
| 02 | තාක්ෂණික දියුණුව හා නව්‍යකරණය සහිත ප්‍රයෝගික විසඳුමක් යෝජනා කර තිබීම, විසඳුම සඳහා ඵලදායිතා සංකල්ප භාවිතා කර තිබීම | 25 |
| 03 | නවීන තාක්ෂණය යොදා ගෙන තිබීම | 20 |
| 04 | නිර්මාණශීලිත්වය | 15 |
| 05 | අන්තර්ගතය(පෙළගැස්ම) | 5 |
| | මුළු ලකුණු | 100 |

**2. ඵලදායිතාවය හා නව්‍යකරණය අනුව සැකසූ AI වීඩියෝපට තරගය**

| **අංකය** | තරග නිර්ණායක | නිශ්චිත ලකුණු මට්ටම |
|---|---|---|
| **01** | ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අවස්ථාවක් නිවැරදිව හඳුනාගෙන තිබීම | 20 |
| **02** | විසඳුම සඳහා ඵලදායිතා සංකල්ප භාවිතා කර තිබීම | 25 |
| **03** | තාක්ෂණික දියුණුව හා නව්‍යකරණය සහිත ප්‍රයෝගික විසඳුමක් යෝජනා කර තිබීම | 15 |
| **04** | AI Prompt භාවිතා කිරීම හා නිර්මාණශීලිත්වය | 35 |
| **05** | අන්තර්ගතය(පෙළගැස්ම) | 5 |
| | මුළු ලකුණු | 100 |

- තරග සඳහා අවුරුදු 16 – 24 අතර දිස්ත්‍රික්කයේ ඕනෑම තරුණ දරුවකුට සහභාගි විය හැකිය.

- ජයග්‍රාහකයින් සැප්තැම්බර් 8 - 14 සතිය තුළ ඔබ දිස්ත්‍රික්කයේ පැවැත්වෙන ඵලදායිතා ප්‍රවර්ධන සතියේ දී සුදුසු ස්ථානයක මහජන ප්‍රදර්ශනය සහ තරගකරුවන්ගේ නිර්මාණ එළිදැක්වීමටත් එම අවස්ථාවේදීම එම ඉදිරිපත් කිරීම පිළිබඳ වාචිකව ඇගයීමට ලක්කිරීමක් සිදු කිරීමට කටයුතු කරයි.

- සෑම දිස්ත්‍රික්කයකම **ප්‍රථම ස්ථානය ලබාගන්නා ජයග්‍රාහකයින් කොළඹදී පැවැත්වීමට නියමිත ජාතික ඵලදායිතා සම්මන්ත්‍රණයේදී ඇගයීමට ලක් කරන අතර සෙසු ජයග්‍රාහකයින් සඳහා සහතික පත්‍රයක් ප්‍රධානය කරයි.**